www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ජවිපෙ සහ ෆොන්සේකා අතර ප්‍රතිගාමී සන්ධානයක්

## Sri Lanka: A reactionary alliance between the JVP and Fonseka

**කොළඹ දිස්ත්‍රික්කය සඳහා තරග වදින සසප අපේක්ෂිකා**

**විලානි පීරිස් විසිනි**

**2010 මාර්තු 5**

අප්‍රේල් 8 වන දා ශ්‍රී ලංකාවෙහි පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරනය සඳහා වූ උද්ඝෝෂනය සුවපහසු අනියත දේශපාලන විවාහයක් සිදු වී ඇත. එනම් ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ද රටේ හිටපු හමුදාපති ජනරාල් සරත් ෆොන්සේකා ද අතර දීගය යි. ජනාධිපති මහින්ද රාජපක්ෂ බලයෙන් පහ කර දැමීම සඳහා කුමන්ත්‍රනය කලේ ය යන අනුමාන චෝදනාව මත ෆොන්සේකා දැනට මිලිටරියේ අත් අඩංගුවෙහි පසු වෙයි.

මාධ්‍යවලින් තව මත් "මාක්ස්වාදීන්" හැටියට සාවද්‍ය ලෙස හැඳින්වෙන ජවිපෙ 1960 ගනන්වල දී පිහිටුවනු ලැබුනේ ගරිල්ලා සංවිධානයක් වශයෙනි. එය ගුවේරාවාදය ද මාඕවාදය ද මත පදනම් විය. 1970 ගනන්වල දී සහ 1980 ගනන්වල දී ජවිපෙ ආරක්ෂක හමුදාවලට එරෙහිව සටන් වැදුනේ ය. දැන් කොළඹ දේශපාලන සංස්ථාපිතයේ කොටසක් බවට පත් වී සිටින එය සෘජුව ම ප්‍රතිගාමී ජාතිභේදවාදී දේශපාලනය මත පදනම් වී ගෙන සිටී. බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව රාජපක්ෂ යලි ආරම්භ කල, පසු ගිය මැයි මාසයේ එල්ටීටීඊයේ පරාජයෙන් අවසන් වුනු යුද්ධයට ජවිපෙ සහාය දුනි.

ජනවාරි 26 දා පැවති ජනාධිපතිවරනයේ දී, විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස සලකා ජනරාල් සරත් ෆොන්සේකාට සහාය දීමේ දී ජවිපෙ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සමග එක් විය. එල්ටීටීඊයට එරෙහි යුද්ධයේ දී මිලිටරියට නායකත්වය දුන් ෆොන්සේකා, සටන් අවසන් වූ පසුව රාජපක්ෂ සමග භේද වී, ජනාධිපතිවරනය සඳහා තරග වදිනු පිනිස ගිය නොවැම්බරයේ තනතුරින් ඉල්ලා අස් විය. කොළඹ පාලක කව තුල හට ගෙන ඇති කන්ඩායමික ආරාවුල්වල කටුකත්වය කෙබඳු ද යත්, මැතිවරනයෙන් පසුව ආන්ඩුව ෆොන්සේකාත් ඔහුගේ ආධාරකරුවන් සමහරෙකුත් අත් අඩංගුවට ගත්තේ ය.

විරුද්ධ පක්ෂ අවුලකට පත් කරමින් මිලියන 1.8කට ආසන්න පුලුල් පරතරයකින් ෆොන්සේකා මැතිවරනයේදී පරාජය විය. බොහෝ දුරට සිංහල ජනයා වෙසෙන දකුනේ ගම්බද ප්‍රදේශවල දී රාජපක්ෂ ෆොන්සේකා පරදා අතිමහත් ජයක් ලැබී ය. එහි ලා ප්‍රධාන කොට ම බලපෑවේ, දෙදෙනා සෑම අතකින් ම එක හා සමාන වැඩ පිලිවෙලවල් දෙකක් මත මැතිවරනය සඳහා ඉදිරිපත් වීම යි. යුද්ධය ජය ගත්තේ තමා යැයි දෙදෙනා ම කියා පෑහ, සුබවාදී ආර්ථික අනාගතයක් ගොඩ නගන බවට දෙදෙනා ම ප්‍රතිඥා දුන්හ. මිලිටරියේ මිනීමරු ආක්‍රමනවලින් ද ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනයන්ගෙන් ද එල්ල වුනු පීඩාව විඳ තිබුනු උතුරෙහි සහ නැගෙනහිරෙහි බොහෝ දෙමල ජනයා කොහෙත්ම ඡන්දය නො දුන්හ.

කෙසේ වුව ද මැතිවරනයෙන් පසුවත් ෆොන්සේකා සිය දේශපාලන අභිලාෂයන් අත් හලේ නැත. ඔහු ශ්‍රේෂ්ඨාධිකරනයේ දී මැතිවරන ප්‍රතිඵලය අභියෝගයට ලක් කරමින් සිටින අතරවාරයේ, රඳවා තබා ගෙන සිටින තතු යටතේ ම කොළඹ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු අසුනකට තරග වදී. ඔහුගේ අභිප්‍රාය වූයේ ජවිපෙ-එජාප මැතිවරන සන්ධානයේ නායකයා වීම යි. එහෙත්, පොදු වැඩ පිලිවෙලකට සහ පොදු ඡන්ද ලකුනකට එකඟ වන්නට විරුද්ධ පක්ෂ දෙක අසමත් විය.

එජාපය සිතන පරිදි, ෆොන්සේකා ඉල්ලා සිටියේ ඉතා ඉහල දේශපාලන වටිනාකමකි. පෙබරවාරි 21 දා සන්ඩේ ටයිම්ස් පුවත්පත කියන්නේ, තමන් "එජාපය වෙනුවෙන් 'කොන්ත්‍රාත් පදනමේ රැකියාවක්' කරන්නෙකු ලෙස දකිනවාට" ෆොන්සේකා "කැමති නැතැ"යි ජනරාල්වරයාගේ බිරිඳ වන අනෝමා

ෆොන්සේකා එජාප නායක රනිල් වික්‍රමසිංහට පැහැදිලි කල බව යි. සැබවින් ම ඔහු ඉල්ලමින් සිටියේ එජාපයේ පාර්ලිමේන්තු කන්ඩායමේ නායකකම යි. මන්ද, එවිට මැතිවරන ප්‍රතිඵලය පදනම් කර ගෙන අගමැති හෝ විපක්ෂ නායකයා බවට පත් වීම සහතික වන බැවිනි. යෝජනාව පසෙක ලූ වික්‍රමසිංහ එජාප නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පෙරමුනේ නියෝජ්‍ය නායකත්වය ෆොන්සේකාට පිලිගැන්වී ය. එහෙත් ජනරාල්වරයා එය ප්‍රතික්ෂේප කලේ ය.

මැතිවරනය තරග කිරීමට ජවිපෙ පිහිටුවා ගත් මැතිවරන පෙරමුන වන ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයේ (ඩීඑන්ඒ) නායකත්වයට විශ්‍රාමික ජනරාල්වරයා පත් වූයේ එලෙස ය. ඩීඑන්ඒහි ඉහල ම තානාන්තරය ද කොලඹ දිස්ත්‍රික්කය සඳහා ඉදිරිපත් කරන එහි නාම යෝජනා පත්‍රයෙහි පලමු ස්ථානය ද ෆොන්සේකාට ලබා දීමේ දී එජාපයට වැනි කිසිදු මනස්තාපයක් ජවිපෙට නැත. මැතිවරනයෙන් ෆොන්සේකා තේරී පත් වුව හොත් ඩීඑන්ඒ පාර්ලිමේන්තු කන්ඩායමේ නායකත්වය ඔහුට හිමි වන බවට ජවිපෙ සහතික වී ඇත.

ෆොන්සේකාට නම් මෙය නුහුරු නුපුරුදු සැකැස්මක් බවට කිසිදු සැකයක් නැත. මිලිටරි සංස්ථාපිතයේ මිනිසෙකු වන ඔහුට වැඩි හුරු පුරුදු බවක් දැනෙනු ඇත්තේ රටේ විරාගත ධනේශ්වර පක්ෂ දෙක වන එජාපය හෝ රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) තුල දී ය. එහෙත් ඔහු දැන්, තමන් හමුදාවේ කනිෂ්ඨ නිලධාරියෙකුව සිටිය දී හමුදාව එරෙහිව සටන් වැදි ජවිපෙහි ප්‍රධාන අපේක්ෂකයා බවට පත්ව සිටී. වඩා පුලුල් සැලසුම් සිත තබා ගෙන ඒවා මුදුන් පත් කර ගැනීම සඳහා පා තැබිය හැකි සුවපහසු පියගැටයක් ලෙස ෆොන්සේකා ජවිපෙ යොදා ගනිමින් සිටින බව පැහැදිලි ය. ඔහු ජවිපෙට එක් වී නැත, එම පක්ෂයේ ක්‍රියා මාර්ගයෙන් සහ විනයෙන් බැඳී නැත.

ෆොන්සේකා සහ ජවිපෙ සතු පොදු දෙය නම් සිංහල ස්වෝත්තමවාදය කෙරෙහි ඔවුන් තුල පවතින කැප වීම යි. එල්ටීටීඊය සමග පැවති යුද්ධය අවසන් කිරීම සඳහා "දේශපාලන විසඳුමකට" එලඹීමට එජාපය මෙන් ජවිපෙ පක්ෂව කතා නොකලේ ය. සාමාන්‍ය වැටහීම අනුව දේශපාලන විසඳුම යන්නෙන් අදහස් වන්නේ පලාත් මට්ටමින් උතුරට සහ නැගෙනහිරට සීමිත බලතල බෙදා හැරීමේ රූපාකාරයෙන් දෙමල ප්‍රභූන්ට සහනයක් සැපයීම යි. ඔවුන් දිවයින බෙදනු ඇතැයි කියමින් ජවිපෙ එවැනි යෝජනාවලට විරුද්ධ වී ඇත. "මෙම රට අයිති සිංහලයන්ට" යැයි තමන් දැඩි ලෙස විශ්වාස කරන බවට කැනඩාවෙහි ප්‍රකාශයට පත් කෙරෙන නැෂනල් පෝස්ට් පුවත්පතට 2008 දී කල සැඳහුම්වලින් පසුව දුරස් වී ගත්ත ද ෆොන්සේකා එහි දී සිය වර්ගවාදී ආකල්ප සෘජුව ප්‍රකාශයට පත් කලේ ය.

ඩීඑන්ඒ පාර්ලිමේන්තු මැතිවරන උද්ඝෝෂනය පදනම් වී තිබෙන්නේ එය "ප්‍රජාතන්ත්‍රවාදය" වෙනුවෙන් පෙනී සිටින්නේ ය යන වංචනික කියා පෑම මත ය. පෙබරවාරි 28 දා නේෂන් පුවත්පත සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක දී ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මෙසේ කී යː "ප්‍රමුඛත්වය හිමි වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ මානව හිමිකම්වලට. එතකොට දූෂනය, වංචාව සහ යහපාලනය වගේ ගැටලු ගැනත් අවධානය යොමු වෙනවා."

ඇත්ත වශයෙන් ම, යුද්ධයේ අවසන් මාසවල දී දහස් ගනන් සිවිල් වැසියන් වග විභාගයක් නැතිව ඝාතනය කිරීම ද ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීම ද ඇතුලු මිලිටරිය කල යුද අපරාධ සම්බන්ධයෙන් රාජපක්ෂ මෙන් ම ෆොන්සේකා ද වග කිව යුතු ය. " එල්ටීටීඊ සැකකරුවන්" ලෙස හඳුන්වා සිය ගනනක් ජනයා අත්තනෝමතික ලෙස රඳවා තබා ගෙන සිටින අතර, ආරක්ෂක හමුදා සමග එක්ව කුමන්ත්‍රනකාරීව ක්‍රියා කරන ආන්ඩුවට හිතපක්ෂපාතී ඝාතක කල්ලි අතින් තවත් සිය ගනනක් ඝාතනයට හෝ "අතුරුදන්" වීමට ලක්ව ඇත. "රන විරුවන්ගේ" කීර්තිය පලුදු කරනු ඇතැයි කියමින් මෙම අපරාධ විමර්ශනය කිරීම සඳහා දැරූ සියලු ප්‍රයත්නවලට ජවිපෙ හැම විට ම විරුද්ධ වී ඇත.

ෆොන්සේකා පෙරට ආවේ ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස නො වේ, වැඩ කරන ජනයා මත සංගත ප්‍රභූවේ ආර්ථික න්‍යාය පත්‍රය පැටවීම සිය අරමුන කර ගත් රාජපක්ෂට-විකල්ප ඒකාධිපතියෙකු ලෙස ය. කලාපය තුල දී ප්‍රධාන බලවතුන් අතර විශේෂයෙන් ම එක්සත් ජනපදය සහ චීනය අතර සතුරුකම් තීව්‍ර වෙමින් පවතින තතු තුල රට නැඹුරු කල යුත්තේ කොයි දිසාවට ද යන කාරනාව ඇතුලුව රාජපක්ෂ සමග ඔහුට තිබෙන මතභේද උපායාත්මක වූ ඒවා ය. "ජාත්‍යන්තර ප්‍රජාව" — එනම්, බටහිර බලවතුන් — සතුරු කර ගැනීම ගැන ජනාධිපතිවරන උද්ඝෝෂනය අතරතුර දී ෆොන්සේකා රාජපක්ෂ විවේචනය කලේ රාජපක්ෂගේ චීන නැඹුරුවට තමන් විරුද්ධ බව අඟවා සිටියේ ය.

ඩීඑන්ඒ මැතිවරන නාම යෝජනා පත්‍රයට හිටපු හමුදා නිලධාරීන් — ෆොන්සේකාගේ හිතමිතුරන් — ගනනාවකගේ නම් ඇතුලත් කර තිබීම අර්ථභාරී කරුනකි. ඔවුන් අතර කොලඹ දිස්ත්‍රික්කයට තරග වදින විශ්‍රාමික කපිතාන් සංජීව කඳනාරච්චි ද කලුතර දිස්ත්‍රික්කයට තරග වදින මේජර් කුඩලිගම ද කුරුනෑගලට තරග වදින මේජර් විමල් රත්නායක ද සිටිති. ඊයේ ඩීඑන්ඒ අපේක්ෂකයන්ට කතා කල ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ හිටපු හමුදා නිලධාරීන් උද්‍යෝගයෙන් වැලඳ ගත්තේ මෙලෙස පවසමිනිː "

අපිත් එක්ක එකතු වෙන ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් වැදුනු ‘රන විරුවන්’ සංඛ්‍යාව එන්න එන්න ම වැඩි වෙනවා.”

ජවිපෙ ෆොන්සේකා සමග සන්ධානයකට එලඹීම දේශපාලන අපේක්ෂා භංගත්වය නිසා කල ක්‍රියාවක් බව නිසැක ය. 2004 දී පැවැත්වුනු පසු ගිය පාර්ලිමේන්තු මැතිවරනයේ දී, ජවිපෙ සිටියේ එවක ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග නායකත්වය දුන් ශ්‍රීලනිපය සමග තනා ගත් මැතිවරන හවුලක ය. එල්ටීටීඊය සමග සාම කතාවල යෙදීම ගැන එජාපයට දැඩිව විරුද්ධත්වය පෑ එය, එජාප ආන්ඩුව බලයෙන් පහ කරන ලෙස කුමාරතුංගට පීඩනය යෙදී ය.

ඒකාබද්ධ අපේක්ෂක ලැයිස්තුවේ පිහිටෙන් ආසන 39ක් දිනා ගත් ජවිපෙ ඇමති තනතුරු හතරක් භාර ගනිමින් පලමු වතාවට සභාග ආන්ඩුවකට පිවිසියේ ය. ප්‍රධාන පක්ෂ දෙක සම්බන්ධයෙන් පුලුල්ව පැතිර ගිය කලකිරීමට ආයාචනය කිරීමෙන් කලින් ජවිපෙ සැලකිය යුතු විරෝධතා ඡන්ද සංඛ්‍යාවක් ඩැහැ ගෙන තිබින. එහෙත් කුමාරතුංගගේ කැබිනට්ටුවේ පාර්ශ්වයක් බවට පත්ව ආන්ඩුවේ වෙලඳ පොල හිතවාදී න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට සහාය දුන් තතු යටතේ ජවිපෙ තමන්ට පැවති සහාය ඉක්මනින් ම අහිමි කර ගත්තේ ය. සුනාමි ආධාර සම්බන්ධයෙන් ඇති වූ නොඑකඟතාවක් සමාවට කරුනක් ලෙස යොදා ගනිමින් වසරකට පසුව ජවිපෙ ආන්ඩුවෙන් ඉවත් වූ නමුදු එහි දේශපාලන වාසනාව යලි පන පෙවුනේ නැත.

තිබුනු සහාය අහිමි වී යාම හෙලිදරව් වේ යැයි බියෙන් 2005 නොවැම්බරයෙහි පැවැත්වුනු ජනාධිපතිවරනයේ දී තමන්ගේ ම අපේක්ෂකයෙකු ඉදිරිපත් නොකල ජවිපෙ රාජපක්ෂට සහාය දුන්නේ ය. රාජපක්ෂ ලද පටු ජයග්‍රහනයෙන් පසුව පක්ෂය විරුද්ධ පක්ෂයෙහි ලැගුම් ගත්ත ද එය ඔහුගේ මිලිටරි අයවැයවලට පක්ෂව ඡන්දය දුන්නේ ය, ඔහු යලි ඇරඹූ යුද්ධයට සහාය පිදී ය, විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුව හොත් ඊට එරෙහිව ඔහුට සහාය දෙන්නට පොරොන්දු වූයේ ය. එමෙන් ම, ප්‍රමුඛතාව හිමි වන්නේ යුද්ධයට ය යන පදනම මත වැටුප් සහ සේවා කොන්දේසි වැඩි දියුනු කර ගැනීම සඳහා කම්කරුවන් ඉදිරිපත් කල ඉල්ලීම් යට ගසනු පිනිස, එය කම්කරු කොටස් අතර තමන්ට පැවති බලපෑම් සහගත භාවය යොදා ගත්තේ ය. සහාය පිරිහෙමින් පැවතීම ජවිපෙ නායකත්වය තුල උපායන් පිලිබඳ කටුක අලකලංචියකට තුඩු දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2008 දී පක්ෂය හැර පලා ගිය සැලකිය යුතු කොටසක් ජාතික නිදහස් පෙරමුන (ජානිපෙ) පිහිටුවා ගෙන රාජපක්ෂ ආන්ඩුවට එක් වූයේ ය.

ජවිපෙ “රනවිරු” ෆොන්සේකා සමග ඈඳී ගෙන ඇත්තේ ඔහු දේශපාලන දිවියොතක් ලෙස සලකා ගෙන ය. පසු ගිය වසරෙහි පැවැත්වුනු පලාත් සභා මැතිවරන මාලාවේ දී ජවිපෙ මහත් විනාශයකට පැමිනවින. එය සතු ආසන සංඛ්‍යාව, මධ්‍යම පලාතේ දී 12 සිට බිංදුව දක්වා ද වයඹ පලාතේ දී 6 සිට 1 දක්වා ද බස්නාහිර පලාතේ දී 23 සිට 3 දක්වා ද දකුනු පලාතේ දී 14 සිට 3 දක්වා ද කඩා වැටුනේ ය. 1960 ගනන්වල දී ජවිපෙ ආරම්භක වශයෙන් සහාය දිනා ගත්තේ මෙම ප්‍රදේශවල වාසය කල අතෘප්තියට පත් ගම්බද සිංහල තරුනයන් අතර නිසා දකුනෙහි පැවති සහාය බිඳ වැටීම විශේෂයෙන් ම සැලකිල්ලට ලක් විය යුතු ය.

ග්‍රාමීය සහ නාගරික සුලු ධනේශ්වරයේ වඩාත් ම අස්ථාවර සහ ව්‍යාකූල භාවයට පත් කොටස් මත පදනම් වූ සිංහල අන්තවාදී පක්ෂයක් සමග රටේ නිලධර කුලයේ අතෘප්තියට පත් තට්ටුවක් කුලුපග කල ෆොන්සේකා-ජවිපෙ සන්ධානයෙන් කිසිදු ප්‍රගතිශීලී ප්‍රතිඵලයක් පහල විය නොහැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය නියෝජනය කරනවා වෙනුවට — නොවැලැක්විය හැකි ලෙස ම වැඩ කරන ජනයාගේ විරුද්ධත්වය අවුලුවනු ඇති ප්‍රතිගාමී වෙලඳ පොල හිතවාදී න්‍යාය පත්‍රය බලාත්මක කිරීමේ හොඳ ම උපාය ලෙස සලකා — ඩීඑන්ජ්ය පාලක ප්‍රභූවේ කොටස්වලට සිය සේවය පුද කරමින් සිටී.

© www.wsws.org